(හත්වැනි පාර්ලිමේන්තුව — පළමුවැනි සභාවාරය)

**අංක. 88.]**

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

## 2011 මැයි මස 04 වැනි බදාදා අ. භා. 1.00 ට

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

0095/'10

1.

ගරු රවී කරුණානායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (5)

(අ) (i) 2010.05.01 දින සිට 2010.07.01 දින දක්වා කැබිනට් අමාත්‍යවරුන් සහ නියෝජ්‍ය අමාත්‍යවරුන් හට ගෙවූ මුදල් ප්‍රමාණය කොපමණද;

(ii) අමාත්‍යවරුන් සහ ඔවුන්ගේ කාර්ය මණ්ඩලය භුක්ති විඳින අනෙකුත් ප්‍රතිලාභ කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0752/'10

2.

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2009 වර්ෂයේ දෙසැම්බර් වන විට සීමාවාසික පුහුණු කාලසීමාව අවසන්කර ඇති අධ්‍යාපන විද්‍යාපීඨ ඩිප්ලෝමාධාරීන් සංඛ්‍යාව කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එම ඩිප්ලෝමාධාරීන්ට මේ වන තෙක් ගුරු පත්වීම් ලබා දී නොමැති බවත්;

(ii) ඔවුන්ට ගුරු පත්වීම් ලබා දීම සඳහා කළමනාකාර සේවා දෙපාර්තමේන්තුවෙන් මේ වන තෙක් අනුමතිය ලැබී නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ඇ) (i) එම ඩිප්ලෝමාධාරීන්ට ගුරු පත්වීම් ලබාදීමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, ඒ කවර කාල වකවානුවකදීද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0809/'10

3.

ගරු බුද්ධික පතිරණ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මාතර දිස්ත්‍රික්කයේ, දෙනියාය කලාප අධ්‍යාපන කාර්යාලයට අයත්, පස්ගොඩ කොට්ඨාස අධ්‍යාපන කාර්යාලයෙන් පාලනය වන රජයේ පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පාසල්වල නම්, ලිපිනයන් හා දුරකථන අංක කවරේද;

(iii) එම පාසල්වලින් සිසුන් සියයට අඩු පාසල් සංඛ්‍යාව කොපමණද;

(iv) එම පාසල්වල නම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මෙම කොට්ඨාසයේ ගුරු අතිරික්තයක් ඇති පාසල් තිබේද;

(ii) එම පාසල්වල නම් කවරේද;

(iii) ගුරු ඌනතා පවතින පාසල්වල නම් කවරේද;

(iv) ගුරු ඌනතාවයන් පවතින විෂයයන් කවරේද;

(v) එම ගුරු ඌනතා පවතින පාසල් සඳහා ගුරුවරුන් ලබාදීමට කටයුතු කරන්නේද;

(vi) එසේ නම්, ඒ සඳහා ගතවන කාලය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0870/’10

4.

ගරු ශාන්ත බණ්ඩාර මහතා,— යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) උතුරු පළාතේ තරුණ තරුණියන් ජාතික තරුණ සේවා සභාවට සම්බන්ධ කිරීමට අවශ්‍ය පියවර ගෙන තිබේද;

(ii) එම පළාතේ, එක් එක් දිස්ත්‍රික්කයේ පිහිටුවා ඇති යෞවන සමාජ සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) උතුරු පළාතේ තරුණ තරුණියන් සඳහා වෘත්තීය පුහුණුව ලබාදීමට අවශ්‍ය පියවර ගන්නේද;

(ii) එම පළාත තුළ පිහිටුවා ඇති වෘත්තීය පුහුණු ආයතන සංඛ්‍යාව හා ඒවායේ නම් කවරේද;

(iii) එම ආයතනවල ක්‍රියාත්මකවන වෘත්තීය පුහුණු පාඨමාලා කවරේද;

(iv) ඒ සඳහා තරුණ තරුණියන් ප්‍රමාණවත් පිරිසක් සහභාගී වන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0915/’10

5.

ගරු අජිත් පී. පෙරේරා මහතා,— ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයට අවසන්වරට ඡන්දයෙන් නිලධාරීන් තෝරාගනු ලැබූ වර්ෂය කවරේද;

(ii) එම අවස්ථාවේ එහි සභාපති ධූරයට පත්වූයේ කවුරුන්ද;

(iii) වර්ෂ 2005 මාර්තු, 2008 දෙසැම්බර්, 2009 මාර්තු සහ 2010 ජූලි යන අවස්ථාවන්හිදී ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයට අතුරු කමිටු පත්කිරීමට හේතු වූ කරුණු එක් එක් අවස්ථාවට අදාළව, වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) එම එක් එක් අවස්ථාවේ පත් කළ අතුරු කමිටුවල සාමාජිකයන්ගේ නම් වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 1973 අංක 25 දරන ක්‍රීඩා පනතේ 33 වැනි වගන්තිය ප්‍රකාරව "අතුරු කමිටු" පත්කරනු ලබන අවස්ථා කවරේද;

(ii) ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයට 2005 වර්ෂයේ සිට මේ දක්වා ප්‍රජාතන්ත්‍රවාදී ලෙස නිලධාරීන් තෝරා ගැනීමට තිබූ බාධා කවරේද;

(iii) එම ආයතනයට ප්‍රජාතන්ත්‍රවාදීව නිලධාරීන් තෝරා නොගැනීම ක්‍රිකට් ක්‍රීඩාවේ පැවැත්මට නුසුදුසු බව පිළිගන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) ක්‍රීඩා පනතේ 35 වැනි වගන්තිය අනුව ක්‍රීඩා සමාජවල ඡන්දයෙන් ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයට නිලධාරීන් තෝරා ගැනීම සඳහා කවර දිනයක කටයුතු කරන්නේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1099/'11

6\.

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) කුලියාපිටිය අධ්‍යාපන කලාපයේ කීර්තිමත් ජාතික පාසලක් වන කුලියාපිටිය මධ්‍ය මහා විද්‍යාලයේ හය වැනි ශ්‍රේණිය සඳහා පස්වන ශ්‍රේණියේ ශිෂ්‍යත්වය සමත් සිසුන් ඇතුළත් කර ගැනීමේ ක්‍රමවේදයෙහි අක්‍රමිකතා සිදු වී තිබෙන බව එතුමා දන්නෙහිද?

(ආ) (i) වර්ෂ 2006 ශිෂ්‍යත්ව විභාගය සමත් වූ සිසුන්ගෙන් එම පාසල සඳහා සිසුන් තෝරා ගැනීමට නියමිත වූ කඩ ඉම් ලකුණු මට්ටම කොපමණද;

(ii) කුලියාපිටිය මධ්‍ය මහා විද්‍යාලයේ හය වැනි ශ්‍රේණිය සඳහා සිසුන් ඇතුළත් කර ගැනීමේ ක්‍රමවේදය කවරේද;

(iii) එම ක්‍රමවේදයට පටහැනිව යමින් 2006 ශිෂ්‍යත්ව විභාගය සමත් නොවූ සිසුන් පාසලට ඇතුළත් කර ගෙන තිබේද;

(iv) එසේ නම්, එම සංඛ්‍යාව කොපමණද;

(v) එම සිසුන් පාසලට බඳවා ගත් පදනම කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1105/'11

7\.

ගරු වසන්ත අලුවිහාරේ මහතා,— ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මාතලේ දිස්ත්‍රික්කයේ, විල්ගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, හෙට්ටිපොල, ගොඩඋල්පත පිහිටි රජයේ ඉඩම් බෙදා දීමට පියවර ගෙන ඇති බවත්;

(ii) ඒ සඳහා 1987 වර්ෂයේ සිට එම ඉඩම් භුක්ති විඳිමින් සිටි පිරිස එම ඉඩම්වලින් ඉවත් කිරීමට පියවර ගෙන ඇති බවත්;

(iii) අදාළ ඉඩම් ඔවුන්ට ලබා දීමට ඉඩම් කච්චේරියක් මගින් තෝරාගෙන තිබියදී වෙනත් පුද්ගලයින්ට එම ඉඩම් ලබා දීමට පියවර ගන්නා බවත්;

(iv) එමගින් ඉඩම් භුක්ති විඳිමින් සිටි පිරිසට බලවත් අසාධාරණයක් සිදුවන බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) දැනට ඉහත පරිදි ඉඩම් බෙදා දීමක් සිදු වන්නේ නම්, එය සිදු කරන පදනම කවරේද;

(ii) එම රජයේ ඉඩම් බෙදා දීම හෝ අල්ලා ගැනීම සම්බන්ධ විස්තර කවරේද;

(iii) මෙතෙක් එම ඉඩම් භුක්ති විදි පුද්ගලයින් හට ද ඉඩම් ලබාදීමට සාධාරණ වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කිරීමට පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1127/’11

8.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— උසස් අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ උප කුලපතිවරයා විසින් දැනට භාවිතා කරන නිල රථය කුමක්ද;

(ii) එහි ලියාපදිංචි අංකය කුමක්ද;

(iii) එම රථය භාවිතයට පෙර අංක KE-6021 දරන මෝටර් රථය උප කුලපතිවරයාගේ නිලරථය ලෙස භාවිතා කරනු ලැබුවේද;

(iv) එසේ නම්, එම රථය භාවිතයෙන් ඉවත් කිරීමට හේතුව කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) අංක NA-5873 දරන තවත් වාහනයක් උප කුලපතිවරයාගේ නිල රථය ලෙස භාවිතා කර තිබේද;

(ii) එම රථය අනතුරකට භාජනය වී තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) රේගුව විසින් තහනම් (seized) කරන ලද ලැන්ඩ් රෝවර් ඩිස්කවරි ජීප් රථයක් උප කුලපතිවරයා විසින් භාවිතා කරන්නේද;

(ii) එම රථය වෙනුවෙන් රු. 31,50,000 ක් විශ්වවිද්‍යාලය විසින් ගෙවා තිබේද;

(iii) එම රථය ධාවන තත්ත්වයට සුදුසු ලෙස සෑදීම සඳහා අංක 65, කිරුළ පාර, නාරාහේන්පිට පිහිටි පෞද්ගලික ආයතනයකට භාරදී තිබේද;

(iv) එම ආයතනයට ගෙවන ලද මුදල කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0285/’10

9.

ගරු රවී කරුණානායක මහතා,— ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ජල සම්පාදන සහ ජලාපවහන අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන සහ රාජ්‍ය සංස්ථා කවරේද;

(ii) ඉහත කී අමාත්‍යාංශයේ වත්මන් සමස්ත මාසික සහ වාර්ෂික පිරිවැය කොපමණද;

(iii) ස්ථිර කාර්ය මණ්ඩල සේවක සංඛ්‍යාව සහ ඔවුන්ට මාසිකව ගෙවනු ලබන සමස්ත වැටුප් සහ දීමනා ප්‍රමාණය කොපමණද; සහ

(iv) ජල සම්පාදන සහ ජලාපවහන අමාත්‍යතුමාගේ, නියෝජ්‍ය අමාත්‍යතුමාගේ, එම කාර්ය මණ්ඩලවල වත්මන් සමස්ත මාසික පිරිවැය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0754/'10

10.

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ සිටින විදුහල්පතිවරුන් සංඛ්‍යාව කොපමණද;

(ii) විදුහල්පති සේවයේ සිටින විදුහල්පතිවරුන්ගේ හිඟය හේතුවෙන් දැනට වැඩ බලන විදුහල්පතිවරුන් ලෙස පත්වීම් ලැබ පාසල්වල සේවය කරන විදුහල්පතිවරුන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) විදුහල්පති සේවා ව්‍යවස්ථාව අනුව සෑම වර්ෂයකම ජනවාරි 01 හා ජූනි 01 යන දින දෙකෙන් විදුහල්පති සේවයේ සේවක සංඛ්‍යාව ගණනය කළයුතු බවත්;

(ii) පසුගිය වර්ෂ 15ක පමණ කාල සීමාවකදී නියමිත දින වකවානුවලදී විදුහල්පති සේවයේ උසස්වීම් ලබාදී නොමැති බවත්;

(iii) ඉහත ආ(i) පරිදි විදුහල්පති සේවයේ සේවක සංඛ්‍යාව ගණනය කිරීම සිදුකර නියමානුකූලව පුරප්පාඩු පිරවීම සිදුකරන්නේ නම්, වැඩ බලන විදුහල්පතිවරු පත්කිරීමකින් තොරව විදුහල්පති සේවා ව්‍යාවස්ථාව ක්‍රියාත්මක කළ හැකි බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ඇ) විදුහල්පති සේවා ව්‍යාවස්ථාව අනුව ඉදිරියේදී කටයුතු කරන්නේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0810/'10

11.

ගරු බුද්ධික පතිරණ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මාතර දිස්ත්‍රික්කයේ, දෙනියාය කලාප අධ්‍යාපන කාර්යාලයට අයත්, මොරවක කොට්ඨාස අධ්‍යාපන කාර්යාලයෙන් පාලනය වන රජයේ පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පාසල්වල නම්, ලිපිනයන් හා දුරකථන අංක කවරේද;

(iii) එම පාසල්වලින් සිසුන් සියයට අඩු පාසල් සංඛ්‍යාව කොපමණද;

(iv) එම පාසල්වල නම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මෙම කොට්ඨාසයේ ගුරු අතිරික්තයක් ඇති පාසල් තිබේද;

(ii) එම පාසල්වල නම් කවරේද;

(iii) ගුරු ඌනතා පවතින පාසල්වල නම් කවරේද;

(iv) ගුරු ඌනතාවයන් පවතින විෂයයන් කවරේද;

(v) එම ගුරු ඌනතා පවතින පාසල් සඳහා ගුරුවරුන් ලබාදීමට කටයුතු කරන්නේද;

(vi) එසේ නම්, ඒ සඳහා ගතවන කාලය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0973/'10

12.

ගරු ශාන්ත බණ්ඩාර මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) 2008 වර්ෂයේ 5 වසර ශිෂ්‍යත්ව විභාගයෙන්,

(i) ජාතික වශයෙන් සමත්වීමේ ප්‍රතිශතය කොපමණද;

(ii) සමත්වීමේ ප්‍රතිශතය පළාත්, අධ්‍යාපන කලාප හා අධ්‍යාපන කොට්ඨාස මට්ටමින් වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) වැඩිම සමත් ප්‍රතිශතය හිමි කර ගත් අධ්‍යාපන කොට්ඨාස 3 කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1100/'11

13.

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා,— සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කටුනායක බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළෙහි ප්‍රභූවරුන් සඳහා වෙන් වී ඇති පර්යන්තය (VIP) භාවිතා කිරීමට සුදුසු වන පුද්ගලයෝ කවරුන්ද;

(ii) ඊට අමතරව VIP පර්යන්තය භාවිත කිරීමට අවස්ථාව ලබා දිය හැකි වෙනත් පුද්ගලයන් කවරුන්ද;

(iii) ඉහත (i) සහ (ii) හි සඳහන් පුද්ගලයන් හැරෙන්නට VIP පර්යන්තය භාවිතා කරන වෙනත් පුද්ගලයෝ සිටින්නේද;

(iv) එසේ නම්, පසුගිය වර්ෂය තුළ එම පර්යන්තය භාවිත කළ එවැනි අයගේ නම් කවරේද;

(v) එම පුද්ගලයන් සඳහා VIP පර්යන්තය භාවිතා කිරීමට අවස්ථාව සලසා දුන් පදනම කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1106/'11

14.

ගරු වසන්ත අලුවිහාරේ මහතා,— ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මාතලේ දිස්ත්‍රික්කයේ, යටවත්ත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, සැලගම නාගොල්ල ප්‍රදේශයේ ක්‍රියාත්මක නාමිණී ප්‍රජා ජල ව්‍යාපෘතිය ආරම්භ කිරීමට පෙර ජල මූලාශ්‍ර පිළිබඳ මූලික විමර්ශනයක් කර තිබේද;

(ii) එම ව්‍යාපෘතියට ජලය ලබා ගැනීමට යෝජිත ස්ථානය කවරේද;

(iii) එමගින් පවුල් 273කට ජලය ලබාදිය හැකිද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) මෙම ව්‍යාපෘතිය සඳහා,

(i) වැය කිරීමට යෝජිතව තිබූ මුදල;

(ii) ප්‍රතිලාභ ලබන පවුල්වලින් එකතු කළ මුදල;

(iii) වැය කර ඇති සම්පූර්ණ මුදල;

කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) එම ව්‍යාපෘතියේ කටයුතු පූර්ව විමර්ශනයකින් තොරව සිදු කිරීම නිසා ඉලක්කගත පවුල් 273ට ජලය ලබා දීමට නොහැකි වූ බවත්;

(ii) එම තත්ත්වය මග හැරවීම සඳහා 1989 වර්ෂයේදී පවුල් 36කට ජලය සැපයීම සඳහා ආරම්භ කළ ඇල්ල, නාගොල්ල ජල ව්‍යාපෘතිය නාමිණි ව්‍යාපෘතියට සම්බන්ධ කර ඇති බවත්;

(iii) ඒ හේතුවෙන් ව්‍යාපෘති දෙකම ඵල රහිතව වී ඇති බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ඈ) ඒකාබද්ධ කිරීම නිසා අසාර්ථක වී ඇති මෙම ව්‍යාපෘති දෙක ප්‍රදේශවාසීන්ගේ ඉල්ලීම අනුව වෙන් වෙන් වශයෙන් ක්‍රියාත්මක කරන්නේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

1128/’11

15.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පිළිකා රෝග හඳුනා ගැනීමට හා වකුගඩු බද්ද කිරීමේ ක්‍රියාවලියට පෙර පරීක්ෂණ සඳහා භාවිතා කරන විකිරණශීලී සමස්ථානික (Radio active isotopes) දැනට පිළිකා රෝහලේ හා අනිකුත් රෝහල්වල ප්‍රමාණවත්ව තිබේද;

(ii) නොඑසේ නම්, එම විකිරණශීලි සමස්ථානිකවල හිඟයක් ඇතිවී තිබෙන කාල වකවානුව කවරේද;

(iii) එම විකිරණශීලී සමස්ථානික නොමැතිකම නිසා නැවතී ඇති පරීක්ෂණ වර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත විකිරණශීලී සමස්ථානික ආනයනය කර ගැනීමට පියවර ගෙන තිබේද;

(ii) එසේ නම්, එලෙස ගෙන්වනු ලබන විකිරණශීලි සමස්ථානික කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) විකිරණශීලි සමස්ථානිකවල ඉහත දැක්වූ ආකාරයේ හිඟයක් ඇතිවීමට සහ ගෙන්වා ගැනීම ප්‍රමාදවීමට හේතු කවරේද;

(ii) එම තත්ත්වයට වගකිව යුතු අය කවරුන්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

# ප්‍රධාන කටයුතු ආරම්භයේ දී

## යෝජනා පිළිබඳ දැනුම්දීම

1\.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ කටයුතු,— න්‍යාය පත්‍රයේ ප්‍රධාන කටයුතුවල අංක 1 දරන විෂය පිළිබඳ වැඩ අද දින රැස්වීමේදී අංක 23 දරන ස්ථාවර නියෝගයෙහි විධිවිධානයන්ගෙන් නිදහස් විය යුතු ය.

2\.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ රැස්වීම්,— ස්ථාවර නියෝග 7 හි විධිවිධානවල සහ 2010.07.09 වැනි දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවේ කුමක් සඳහන්ව තිබුණ ද, අද දින රැස්වීම් පැවැත්වෙන කාල වේලා අ. භා. 1.00 සිට අ. භා. 6.30 දක්වා විය යුතු ය. අ. භා. 2.00 ට ස්ථාවර නියෝග 7(5) ක්‍රියාත්මක විය යුතු ය.

3\.

ගරු වික්ටර් ඇන්ටනි මහතා,— පනත් කෙටුම්පතක් ඉදිරිපත් කිරීමේ අවසරය,— පහත සඳහන් පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතුය:—

"ද. මු. දසනායක සමාජ සත්කාරක හා පුණ්‍යාධාර පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි."

---

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*1.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— සුරාබදු ආඥාපනත යටතේ නියමය,— (52 වැනි අධිකාරය වන) සුරාබදු ආඥාපනතේ 22 වැනි උපවගන්තිය යටතේ මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමා විසින් මධ්‍යසාර සඳහා වූ සුරාබදු සම්බන්ධයෙන් පනවනු ලදුව, 2011 ජනවාරි මස 05 දිනැති අංක 1687/18 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.05.03 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අංක 931, 932, 933 සහ 934 දරන සුරාබදු නිවේදන)

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*2.

පළාත් පාලන ආයතන (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත — කාරක සභාව

*3.

පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනත් කෙටුම්පත — කාරක සභාව

*4.

සේවානියුක්තයන්ගේ විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ අරමුදල් පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*5.

විදේශ සේවානියුක්තයන්ගේ විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ අරමුදල් පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*6.

විශ්‍රාම වැටුප් (ආනුෂංගික විධිවිධාන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*7.

සේවක අර්ථසාධක අරමුදල් (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*8.

මුදල් ව්‍යාපාර පනත් කෙටුම්පත,— දෙවැනි වර කියවීම.

*9.

පළිබෝධ නාශක පාලනය කිරීමේ (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*10.

පශු සම්පත් හා ග්‍රාමීය ප්‍රජා සංවර්ධන අමාත්‍යතුමා,— සත්ව පනත යටතේ නියමය,— 1958 අංක 29 දරන සත්ව පනතේ 3, 3අඅ, 11, 26 හා 34 වැනි වගන්ති සමඟ කියවිය යුතු, එකී පනතේ 35 වැනි වගන්තිය යටතේ පශු සම්පත් සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2009 නොවැම්බර් 26 දිනැති අංක 1629/17 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.04.05 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතුය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*11.

වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා තේ මණ්ඩල පනත යටතේ නියෝග,— 1975 අංක 14 දරන ශ්‍රී ලංකා තේ මණ්ඩල පනතේ 5 ආ සහ 5 ඇ වගන්ති සමඟ කියවිය යුතු, එකී පනතේ 25 වැනි වගන්තිය යටතේ ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් සාදන ලද සහ වැවිලි කර්මාන්ත අමාත්‍යවරයා විසින් අනුමත කරන ලදුව 2010 ඔක්තෝබර් මස 27 දිනැති, අංක 1677/14 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.01.04 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*12.

ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යතුමා,— හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත යටතේ නියෝග,— 1998 අංක 21 දරන හිමිකම් ලියාපදිංචි කිරීමේ පනතේ 60 සහ 62 වැනි වගන්ති සමඟ කියවිය යුතු, එකී පනතේ 67 වැනි වගන්තිය යටතේ ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2009 අගෝස්තු 24 දිනැති, අංක 1616/23 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2010.05.06 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*13.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— සුරාබදු ආඥාපනත යටතේ නියමය,— (52 වැනි අධිකාරිය වූ) සුරාබදු ආඥාපනතේ 25 වැනි වගන්තිය යටතේ, සංචාරක ප්‍රවර්ධන අධිකාරියේ අනුමතිය ලත් හෝටල් තුළ මධ්‍යසාර භාවිතය සම්බන්ධයෙන් මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2011 ජනවාරි 21 දිනැති අංක 1689/20 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.02.10 දින ඉදිරිපත්කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අංක 935 දරන සුරාබදු නිවේදනය)

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.**

# වාචික පිළිතුරු අපේක්ෂා නොකරන ප්‍රශ්න

0175/'10

1\.

ගරු අජිත් කුමාර මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) තංගල්ල ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශය තුළ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට අයත් ඉඩම් තිබේද;

(ii) එසේ නම්, එම එක් එක් ඉඩමේ නම, ප්‍රමාණය, අදාළ ග්‍රාම නිලධාරී කොට්ඨාසය, ඉඩමේ ස්වභාවය හා වාර්ෂික ආදායම කොපමණද;

(iii) එම ඉඩම්වල අයිතිය නිත්‍යානුකූලව පුද්ගලයන්ට හෝ ආයතනවලට පවරා තිබේද;

(iv) ඒ කවර කාර්යයක් සඳහා, කවර පදනමකින්ද;

(v) එම පුද්ගලයන්ගේ හෝ ආයතනවල නම, ලිපිනය, පවරා දුන් දිනය, ඉඩමේ ප්‍රමාණය, කාල සීමාව හා කොමිෂන් සභාවට වාර්ෂිකව ලැබෙන ආදායම කොපමණද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ආ) (i) කොමිෂන් සභාවේ ඉඩම් නිත්‍යානුකූල නොවන අයුරින් පුද්ගලයින් හෝ ආයතන විසින් භුක්ති විඳින්නේද;

(ii) එසේ නම්, ඔවුන්ගේ නම්, ඉඩම් ප්‍රමාණය සහ ඒ කවදා සිටද;

(iii) ඒ සම්බන්ධව ගත් ක්‍රියාමාර්ග සහ එහි වර්තමාන තත්ත්වය කවරේද;

(iv) ආරම්භයේදී හා 2009.08.01 දිනට කොමිෂන් සභාවට අයත් ඉඩම් ප්‍රමාණය කොපමණද;

(v) ආරම්භයේ තිබූ ඉඩම් ප්‍රමාණයෙන් අන්සතු කළ ප්‍රමාණය කොපමණද;

(vi) සන්තකය අන්සතු කළ අයගේ නම, ලිපිනය සහ ඉඩම් ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0176/'10

2\.

ගරු අජිත් කුමාර මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) බෙලිඅත්ත ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශය තුළ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට අයත් ඉඩම් තිබේද;

(ii) එසේ නම්, ඒ එක් එක් ඉඩමේ නම, ප්‍රමාණය, අදාළ ග්‍රාම නිලධාරී කොට්ඨාසය, ඉඩමේ ස්වභාවය හා වාර්ෂික ආදායම කොපමණද;

(iii) එම ඉඩම්වල අයිතිය නිත්‍යානුකූලව පුද්ගලයන්ට හෝ ආයතනවලට පවරා තිබේද;

(iv) ඒ කවර කාර්යයක් සඳහා කවර පදනමකින්ද;

(v) එම පුද්ගලයන්ගේ හෝ ආයතනවල නම, ලිපිනය, පවරා දුන් දිනය, ඉඩමේ ප්‍රමාණය, කාල සීමාව හා කොමිෂන් සභාවට වාර්ෂිකව ලැබෙන ආදායම කොපමණද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ආ) (i) කොමිෂන් සභාවේ ඉඩම් නිත්‍යානුකූල නොවන අයුරින් පුද්ගලයින් හෝ ආයතන විසින් භුක්ති විඳින්නේද;

(ii) එසේ නම් ඔවුන්ගේ නම්, ඉඩම් ප්‍රමාණය සහ ඒ කවදා සිටද;

(iii) ඒ සම්බන්ධව ගත් ක්‍රියාමාර්ග සහ එහි වර්තමාන තත්ත්වය කවරේද;

(iv) ආරම්භයේදී හා 2009.08.01 දිනට කොමිෂන් සභාවට අයත් ඉඩම් ප්‍රමාණය කොපමණද;

(v) ආරම්භයේ තිබූ ඉඩම් ප්‍රමාණයෙන් අන්සතු කළ ප්‍රමාණය කොපමණද;

(vi) සන්තකය අන්සතු කළ අයගේ නම, ලිපිනය සහ ඉඩම් ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0177/'10

3.

ගරු අජිත් කුමාර මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ඕකේවෙල ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශය තුළ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට අයත් ඉඩම් තිබේද;

(ii) එසේ නම්, ඒ එක් එක් ඉඩමේ නම, ප්‍රමාණය, අදාළ ග්‍රාම නිලධාරී කොට්ඨාසය, ඉඩමේ ස්වභාවය හා වාර්ෂික ආදායම කොපමණද;

(iii) එම ඉඩම්වල අයිතිය නිත්‍යානුකූලව පුද්ගලයන්ට හෝ ආයතනවලට පවරා තිබේද;

(iv) ඒ කවර කාර්යයක් සඳහා, කවර පදනමකින්ද;

(v) එම පුද්ගලයන්ගේ හෝ ආයතනවල නම, ලිපිනය, පවරා දුන් දිනය, ඉඩමේ ප්‍රමාණය, කාල සීමාව හා කොමිෂන් සභාවට වාර්ෂිකව ලැබෙන ආදායම කොපමණද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ආ) (i) කොමිෂන් සභාවේ ඉඩම් නිත්‍යානුකූල නොවන අයුරින් පුද්ගලයින් හෝ ආයතන විසින් භුක්ති විඳින්නේද;

(ii) එසේ නම්, ඔවුන්ගේ නම්, ඉඩම් ප්‍රමාණය සහ ඒ කවදා සිටද;

(iii) ඒ සම්බන්ධව ගත් ක්‍රියාමාර්ග සහ එහි වර්තමාන තත්ත්වය කවරේද;

(iv) ආරම්භයේදී හා 2009.08.01 දිනට කොමිෂන් සභාවට අයත් ඉඩම් ප්‍රමාණය කොපමණද;

(v) ආරම්භයේ තිබූ ඉඩම් ප්‍රමාණයෙන් අන්සතු කළ ප්‍රමාණය කොපමණද;

(vi) සන්තකය අන්සතු කළ අයගේ නම්, ලිපිනයන් සහ ඉඩම් ප්‍රමාණයන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0178/'10

4\.
ගරු අජිත් කුමාර මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) කටුවන ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශය තුළ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට අයත් ඉඩම් තිබේද;

(ii) එසේ නම්, ඒ එක් එක් ඉඩමේ නම, ප්‍රමාණය, අදාළ ග්‍රාම නිලධාරී කොට්ඨාසය, ඉඩමේ ස්වභාවය හා වාර්ෂික ආදායම කොපමණද;

(iii) එම ඉඩම්වල අයිතිය නීත්‍යානුකූලව පුද්ගලයන්ට හෝ ආයතනවලට පවරා තිබේද;

(iv) ඒ කවර කාර්යයක් සඳහා කවර පදනමකින්ද;

(v) එම පුද්ගලයන්ගේ හෝ ආයතනවල නම, ලිපිනය, පවරා දුන් දිනය, ඉඩමේ ප්‍රමාණය, කාල සීමාව හා කොමිෂන් සභාවට වාර්ෂිකව ලැබෙන ආදායම කොපමණද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ආ) (i) කොමිෂන් සභාවේ ඉඩම් නීත්‍යානුකූල නොවන අයුරින් පුද්ගලයින් හෝ ආයතන විසින් භුක්ති විඳින්නේද;

(ii) එසේ නම්, ඔවුන්ගේ නම්, ඉඩම් ප්‍රමාණය සහ ඒ කවදා සිටද;

(iii) ඒ සම්බන්ධව ගත් ක්‍රියාමාර්ග සහ එහි වර්තමාන තත්ත්වය කවරේද;

(iv) ආරම්භයේදී හා 2009.08.01 දිනට කොමිෂන් සභාවට අයත් ඉඩම් ප්‍රමාණය කොපමණද;

(v) ආරම්භයේ තිබූ ඉඩම් ප්‍රමාණයෙන් අන්සතු කළ ප්‍රමාණය කොපමණද;

(vi) සන්තකය අන්සතු කළ අයගේ නම්, ලිපිනයන් සහ ඉඩම් ප්‍රමාණයන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0179/'10

5\.
ගරු අජිත් කුමාර මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) වලස්මුල්ල ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශය තුළ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට අයත් ඉඩම් තිබේද;

(ii) එසේ නම්, ඒ එක් එක් ඉඩමේ නම, ප්‍රමාණය, අදාළ ග්‍රාම නිලධාරී කොට්ඨාසය, ඉඩමේ ස්වභාවය හා වාර්ෂික ආදායම කොපමණද;

(iii) එම ඉඩම්වල අයිතිය නීත්‍යානුකූලව පුද්ගලයන්ට හෝ ආයතනවලට පවරා තිබේද;

(iv) ඒ කවර කාර්යයක් සඳහා කවර පදනමකින්ද;

(v) එම පුද්ගලයන්ගේ හෝ ආයතනවල නම, ලිපිනය, පවරා දුන් දිනය, ඉඩමේ ප්‍රමාණය, කාල සීමාව හා කොමිෂන් සභාවට වාර්ෂිකව ලැබෙන ආදායම කොපමණද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ආ) (i) කොමිෂන් සභාවේ ඉඩම් නිත්‍යානුකූල නොවන අයුරින් පුද්ගලයින් හෝ ආයතන විසින් භුක්ති විඳින්නේද;

(ii) එසේ නම්, ඔවුන්ගේ නම්, ඉඩම් ප්‍රමාණය සහ ඒ කවදා සිටද;

(iii) ඒ සම්බන්ධව ගත් ක්‍රියාමාර්ග සහ එහි වර්තමාන තත්ත්වය කවරේද;

(iv) ආරම්භයේදී හා 2009.08.01 දිනට කොමිෂන් සභාවට අයත් ඉඩම් ප්‍රමාණය කොපමණද;

(v) ආරම්භයේ තිබූ ඉඩම් ප්‍රමාණයෙන් අන්සතු කළ ප්‍රමාණය කොපමණද;

(vi) සන්තකය අන්සතු කළ අයගේ නම්, ලිපිනයන් සහ ඉඩම් ප්‍රමාණයන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0180/'10

6.

ගරු අජිත් කුමාර මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) වීරකැටිය ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශය තුළ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට අයත් ඉඩම් තිබේද;

(ii) එසේ නම්, ඒ එක් එක් ඉඩමේ නම, ප්‍රමාණය, අදාළ ග්‍රාම නිලධාරී කොට්ඨාසය, ඉඩමේ ස්වභාවය හා වාර්ෂික ආදායම කොපමණද;

(iii) එම ඉඩම්වල අයිතිය නිත්‍යානුකූලව පුද්ගලයන්ට හෝ ආයතනවලට පවරා තිබේද;

(iv) ඒ කවර කාර්යයක් සඳහා කවර පදනමකින්ද;

(v) එම පුද්ගලයන්ගේ හෝ ආයතනවල නම, ලිපිනය, පවරා දුන් දිනය, ඉඩමේ ප්‍රමාණය, කාල සීමාව හා කොමිෂන් සභාවට වාර්ෂිකව ලැබෙන ආදායම කොපමණද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ආ) (i) කොමිෂන් සභාවේ ඉඩම් නිත්‍යානුකූල නොවන අයුරින් පුද්ගලයින් හෝ ආයතන විසින් භුක්ති විඳින්නේද;

(ii) එසේ නම්, ඔවුන්ගේ නම්, ඉඩම් ප්‍රමාණය සහ ඒ කවදා සිටද;

(iii) ඒ සම්බන්ධව ගත් ක්‍රියාමාර්ග සහ එහි වර්තමාන තත්ත්වය කවරේද;

(iv) ආරම්භයේදී හා 2009.08.01 දිනට කොමිෂන් සභාවට අයත් ඉඩම් ප්‍රමාණය කොපමණද;

(v) ආරම්භයේ තිබූ ඉඩම් ප්‍රමාණයෙන් අන්සතු කළ ප්‍රමාණය කොපමණද;

(vi) සන්තකය අන්සතු කළ අයගේ නම්, ලිපිනයන් සහ ඉඩම් ප්‍රමාණයන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?